




සහන් වීරසේකර

ප්‍රංශයෙන් උදේ පාන්දර ඇමැතුමක්. කවුද යකෝ උදේ පාන්දර හඬලන කුකුළා යයි සිතමින් බුද්දක යහන අග්ගිස්සේ තිබ්බ ජංගම දුරකථන රාජයා දෙස මාර බැල්මක් හෙලා දකුණු කර්ණය විවෘත කලා. සුපුරුදු හඬින් "ලොක්කා නිදිද?" ඉතා තැන්පත් ස්වරයෙන් බට්ටා අසයි. මතක පොතේ උරුමක්කාරයා බටුවත්ත, "මචෝ නිදිද" නැවත අසයි. අපිට හවස දැන්. බුද්දකගේ නිදි දැහැන පැල දොරින් පත බැ වෙද්දී ලකියපන්ල ඒ මගේ කටහඩ අවදි වුන මොහොතයි.

## උනන්දුවගේ නිපන්දුව

ඒ කුමාර නාලන්ද විදුහල් මාතාව තුළ ඉගෙනීම ලැබූ මෙන්ම ක්‍රිකට් අත්පොත තැබූ විය. කුමාර ගැන හොඳින් විමසිලිව සිටි එවකට පුහුණුකරු වූ නෙල්සන් මැන්ඩිස් මහතා දිනක්, කුමාරට අර ගෙදර ඇඳන් යන කමිසේ අරං එනවා යයි අණ කලේ මොහොතකට කුමාරව ද තිගැස්මට ලක් කරමින්. කමිසය රෝල් කර පන්දු යවන සිමා ඉරේ රදවා,

"ආ දැන් බෝල් කරනවා."

කුමාරට දෙයියෝ බුදුන් සිහිවිය, බස් එකේ ඇඳන් යන අත් කොට අංගවස්ත්‍රයට වන්නට යන ඉරණම පැහැදිලිවිය. නමුත් එතැන් පටන් ඔහුගේ නිපන්දුවද ලොප් විය. විනය දැඩි විය. අඛණ්ඩ පුහුණුව සහ ගුරු අත හිත තුල ලැබූ පන්නරය අද කාලේ එවුන්ට උගත් පාඩම් පොතක් කියාදෙයි. පසු කාලෙක කුමාර මද වේග දඟ පන්දු යවන්නෙක් බවට පරිවර්තනය වූ අතර 1994 ජාතික ක්‍රිකට් කණ්ඩායමේ දොරටු

සචින් ය. මොහොතකට සිගිරි අප්සරාවන් ද ගැස්සී ඉස්සි රංගිරි පිටිය වෙත කන් යොමා සිටියේ අත් දෙකෙන්ම තිසර පටි රදවා ගනිමින් කුමක් වේ දැයි සිතමින්. කුමාරගේ ඇගිල්ල එසවිය මොහොතින් සචින් පිටවිය.

අයුරු කුමාට අවබෝධ විය. චන්ද්‍රපෝල් වරදකාරී කපටි බැල්ම සහ පිත්ත පොලවේ නැවත නැවත සැවිනීම, කුමාගේ මනසේ රිදුම් දිය. සැනෙකින් විනිසුරු තීරණය බලාත්මක විය. චන්ද්‍රපෝල් පිට විය. කපටිකම එට්ටු විය. ලාංකීය ක්‍රිකට් විනිසුරුවරයකුගේ අභිමානය ලෝක තිරය මත ප්‍රත්‍යක්ෂ විය. දුෂාන්ති සිනාවෙයි. ජිවිත රසය ද ගමේ කෑම ජාති වලට ඔහුගේ කැමැත්ත ද එක ලෙස දන්නා ජිවිතයේ පංගුකාරිය වූ ඇයයි.

## අළුබදුන සහ අර්ධ ශතකය

එංගලන්ත - ඕස්ට්‍රේලියා අළුබදුන ක්‍රිකට් තරගාවලිය දෙවෙනි වන්නේ ලෝක ක්‍රිකට් කුසලානයට පමණක් දැයි මගේ ඉස්මොළ ගෙඩියට නොතේරේ. හැබැයි ක්‍රිකට් විනිසුරුවෙක්ට අළුබදුන ක්‍රිකට් තරගාවලිය යනු සුවිශේෂී අවස්ථාවකි. මෙවර ඕස්ට්‍රේලියාවේ මෙල්බන් නුවරට මේ දෙසැම්බරයේ කුමාර එන්නේ Boxing day හෙවත් නත්තල් දිනට පසු දින ඇරඹෙන අළුබදුන ක්‍රිකට් තරගාවලිය උදෙසා පැවැත්වෙන තෙවෙනි ටෙස්ට් තරග විනිශ්වය සඳහායි. ලාංකීය ක්‍රිකට් විනිසුරුවරයෙක් අන්තර්ජාතික ක්‍රිකට් පිටියේ තම 50 වැනි ටෙස්ට් තරග සැතපුම පසු කරද්දී වර්තමාන ලාංකීය ක්‍රිකට් ක්‍රීඩාවද ක්‍රීඩකයෝ ද පාලකයෝ ද



අත් දෙකෙන් හය හතර කියන අන්තර්ජාතික ක්‍රිකට් පසිඳුවා

**පැන්සල් කුමාරයා හෙවත් අපේ කාලයේ "උනන්දුවා"**

# අන්තර්ජාතික ක්‍රිකට් විනිසුරු කුමාර ධර්මසේන

කාලයයි. මද වේග හෝ වේග සීමා මිනුම් නොතිබූ කාලයක ඔහුගේ ක්‍රිකට් ගුරුවරයා වුයේ නෙල්සන් මැන්ඩිස් මහතායි. සාමාන්‍ය පවුලකින් පැවත එන කුමාර මොනයම් අගහිගකම් අපහසුතා තිබුනත් ක්‍රීඩාව කෙරෙහි තිබු උනන්දුව අප්‍රමාණයි. පාසල් ක්‍රිකට් තරග තුළ කතා බහට ලක්වෙන නාමයක් බවට ක්‍රීඩාකරණයේ ඉගි පල කළ කුමාරට දැවෙන දුෂ්කර කාරණයවුයේ නිතර දෙවේලේ යැවෙන නිපන්දුවයි. කුමාරට මෙය දැඩි හිසරදයක් මෙන්ම කනස්සල්ලක් වුයේ සෑම තරගයකදීම පන්දු යවන්නන්ගේ සටහනේ තම නම ඉදිරියෙන් නිපන්දු සංඛ්‍යාවක් ලකුණු වී තිබීමයි.

පුහුණුකරුවන් කෙතරම් කියා දුන්නත් ඔවදන් දුන්නත් ජන්මෙට වඩා පුරුද්ද ලොකුයි කියන්නාක් මෙන් නිපන්දු යැවීම නතරනම් නොවිය. අපේ පාසල් කාලයේ සපත්තු වල හුණු පිරියම, එක කමිසයක් පුහුණුවට සහ අනික කමිසය බසයෙන් ගෙදර යද්දී ඇඳන් යාමත් සාමාන්‍ය දෙයක් විවරකරගන්නේ හැකියාවට රැකියාවක් ලබන්නාක් මෙනි.

## වැරදුනු කුරුමානම සහ කපටිකම

ලෝක පූජිත 96 ලෝක ශූර ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමේ සිටි කුමාර පිත්තට සහ පන්දුවට විශ්‍රාම දෙන්නේ ක්‍රීඩාව තුල රැඳෙමින් ක්‍රිකට් විනිසුරුකම තෝරා ගනිමින්ය. ඉසවුව 2009 වසරේ රංගිරි දඹුලු ක්‍රීඩාංගනයයි. ඉන්දියාවත් ශ්‍රී ලංකාවත් අතර පැවති එක්දින ක්‍රිකට් තරගය, කුමාරගේ අන්තර්ජාතික ප්‍රවිෂ්ටය විය. ඉන්දියාව පන්දුවට පහර දෙයි. ප්‍රබල ඉල්ලීමක්, ක්‍රීඩකයෝද තරග විචාරකයෝ ද යටිගිරියෙන් බෙරිහන් දෙති. පින්තූර ගන්නා යන්ත්‍ර ද සංස්කරණ මැදිරි ද පාලකයෝ ද තිරකයෝ ද නෙත් යොමා සිටි. පිතිකරු නැවත විකාශය තිරයේ දිස්විය. බැලූ කුමාරගේ නලලත තෙත් විය. කෝඩුකාර විනිසුරුගේ තීරණය වැරදි බව තිරයේ දර්ශන සපථ කළේය. කුමාරගේ පළමු කුරුමානම නිවැරදි නොවීය. හැබැයි ඔහුගේ ව්‍යවහාරික පුහුණුව සහ කැපවීම 2015 වනවිට ලාංකීය ලාබාලතම හොඳම ජාත්‍යන්තර ක්‍රිකට් විනිසුරුවා ලෙස ඔහුගේ නම පුවත් සිරස්තල අතර රැඳවීමට සමත්විය.

ඉගෙන ගත් දෙයට වඩා ඉගෙන ගත යුතු දේ බොහොමයි කුමා අපිට කියයි.
වරක් බටහිර ඉන්දීය කොදෙව් තරගයකදී ප්‍රතිවාදීන් දැඩි ඉල්ලීමක්. පිතිකරු චන්ද්‍රපෝල්. සුළඟේ දිශානතිය නිසාදෝ කුමාරට කිසිවක් ඇසුනේ ද නැත. මොහොතක් ලොව නිසසල බවත් පිත්තේ පන්දුව දැවටුනා ද නැද්දෝ යන්න ප්‍රේහේලිකාවක් විය. කුමා කලබල නොවිය, ඔහුගේ උකුසු ඇස් චන්ද්‍රපෝල් දෙසම විය. පිතිකරු සීනි කාපු අන්දරේ මෙන් හැසිරෙන

මුකවාඩම් පැළඳිය යුත්තේ ඉස්සරහට නොව පස්සට බවයි බුද්දක පැටියාට හිතෙන්නේ.

ක්‍රීඩාව සැමට ඉදිරියෙන් පවතින බව Game is bigger than all of us ප්‍රත්‍යක්ෂ ඇති සැටියක් බව කුමා අපිට මතක් කර දෙයි. ක්‍රීඩකයෝ මෙන්ම පාලකයෝ ද ගිරා ඇමතියෝ ද තාවකාලිකයි. ක්‍රිකට් සදාකාලිකයි. ලෝක ක්‍රිකට් කුසලානයක ජයාග්‍රාහී කණ්ඩායමක තරග කල ලොව ලෝක ක්‍රිකට් කුසලානයක අවසන් මහා තරගයක් විනිශ්වය කල එකම කුමාරයා ද නොදැවෙනි උනන්දුවා ද මට නම් ඔබම ය. දිනක නුඹේ නමට ජනයා ඔල්වරසන් නගනු ඇත. මම ජිවත්ව සිටියොත් මමත් උඹට මොර දෙනවා. මමත් ක්‍රිකට් විනිසුරුවෙක් නිසාවෙන් සහ අපේ මිත්‍රත්වය දබර ඇගිල්ලට වඩා සෙනෙහෙන් මහත් නිසාවෙන්. සැරදේ ශ්‍රීමත් කුමාර ධර්මසේන..